08-01-2019 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්

**සාරය:** සුමිහිරි දරුවනි, පාරිශුද්ධියට පත් වීමට නම්, ස්මෘති වන්දනාව අවශ්‍යමය. මෙය ප්‍රධාන විෂයයි. යෝගා බලය තුළින් ඔබට සේවා හැකියාවෙන් හා ගුණාංග වලින් යුතු බවට පත් විය හැකිය.

**ප්‍රශ්නය:** ඔබ දරුවන් ඉගෙන ගන්නා යෝගාව අසහාය වන්නේ කෙසේ ද?

**පිළිතුර:** අද වන තෙක්ම, මිනිසුන් එකිනෙකාට ඉගැන්වූ සහ ඉගෙනගත් යෝගාවන් මිනිසුන් මිනිසුන් අතර සම්බන්ධයන්ය. කොහොමනමුත්, අපිට දැන් ඇත්තේ අශරීරික කෙනා හා එකතු වීමේ යෝගාවයි. අශරීරික ජීවාත්මයන් අශරීරික පියාව සිහිකරන විට එය අසහායයි. ලෝකයේ මිනිසුන් දෙවියන් සිහිකරන විට එය කරන්නේ ඔහු පිළිබඳ හැඳින්වීමක් නැතිවයි. එසේ කවුරු හෝ ගැන ඔහු කරන ක්‍රියාවන් නොදැන සිහිකිරීම භක්ති ක්‍රමයයි. ඥානනය වූ දරුවන්, ඔහුව සිහි කරන්නේ හැඳිනීම ඇතිවයි.

ඕම් ශාන්ති. ආධ්‍යාත්මික පියා මෙහි සිට ඔබ දරුවන්ට විස්තර කරයි. ඔබ දරුවන් පළමුවෙන්ම පියාගේ හැඳින්වීම ලබා ඇත. දරුවෙක් උපන් විට, ඔහුට පළමුවෙන්ම ලැබෙන හැඳින්වීම දෙමාපියන් ගැනයි. ඔබ ද පියාගේ, නිර්මාණකයාගේ හැඳින්වීම ලබා ඇත්තේ ඔබේ උත්සාහයේ අනුපිළිවෙළටයි. ඔබ දරුවන් දන්නවා පියා ඉහළම ඉහළ බව, ඉතින් ඔබ අන් අයට ද ඔහුගේ පැසසුම කිව යුතුයි. ඔබ එම පැසසුම මෙසේ ගයයි ඕම් නමෝ ශිවා. 'බ්‍රහ්මාට නමස්කාර වේවා' සහ 'විෂ්ණුට නමස්කාර වේවා' යන්න නිවැරදි සේ නොපෙනේ. 'ශිවාට නමස්කාර වේවා' යන්න නිවැරදි බව පෙනේ. බ්‍රහ්මා දේවතාවට නමස්කාර වේවා සහ විෂ්ණු දේවතාවට නමස්කාර වේවා යන්න ද නිවැරදි සේ පෙනේ. ඔවුන්ට දේවතා යන නම දිය යුතුයි. දෙවියන් වූ කලී ඉහළම ඉහළ කෙනාය. කෙනෙක් ආ විට, සියල්ලට පළමු නියතයෙන්ම පියාගේ පැසසුම ඔහුට කිව යුතුයි. ඔහු උත්තරීතර පියාය. පියාගේ පැසසුම කරන්නේ කෙසේදැයි දරුවන්ට අමතක වේ. සියල්ලට පළමු, ඔහු උත්තරීතර පියා, ගුරුවරයා සහ සත්ගුරු ද බව විස්තර කරන්න. තුනම සිහිපත් කළ යුතුමය. ඇත්තෙන්ම ඔබ මේ ස්වරූප තුනෙන්ම ශිව බාබා පමණක් සිහිකළ යුතුය. මෙය දැඩිව ස්ථිර කරගත යුතුයි. ඔබ පියාගේ පැසසුම දන්නා අතර, ඒ නිසාමයි ඔහු පසසන්නේ. ඔවුන් කියන්නේ ඉහළම ඉහළ පියා ගස් ගල් අතරේ සිටිනා බවයි. ඔහු මනුෂ්‍ය ස්වරූපයෙන්ම සිටින බව ද ඔහු කියයි. කොහොමනමුත්, ඔහුට නිරතුරුවම මනුෂ්‍ය ශරීරයක සිටිය නොහැකිය. ඔහු එය ණයට ගන්නවා පමණි. ඔහුම මෙසේ කියයි මා මෙයාගේ ශරීරයෙන් සහය ගන්නවා. ඉතින්, පළමුවෙන්ම ස්ථිරවම කළ යුතු දේ නම්, පියා වූ කලී සත්‍යය බවය. ඔහු පමණයි කියන්නේ සත්‍ය නාරායන්ගේ කතාන්දරය. සත්‍ය පියාම පමණි ඔබව සාමාන්‍ය මිනිසෙකුගෙන් නාරායන් බවට වෙනස් කරන්නේ. ස්වර්ණමය යුගයේ දී, ලක්ෂ්මි සහ නාරායන්ගේ රාජධානිය තිබුණි. දැන් පමණයි ඔබ තේරුම් ගන්නේ ඔවුන් එසේ වූයේ කෙසේද, ඔවුන් එසේ කරවූයේ කවුද, කතාන්දරය කීවේ කවදාද සහ රාජයෝගා ඉගැන්වූ කාලය කුමක්ද කියා. අන් සියලු යෝගා වර්ග මනුෂ්‍යයන් සහ මනුෂ්‍යයන් අතරයි. මනුෂ්‍යයින් අශරීරික කෙනා සමඟ යෝගාවක් ගැන නොදැන සිටි අතර, ඔහු ගැන හැඳින්වීමක් ද නොවීය. මෙකල ද, මිනිසුන් ශිවා සමඟ යෝගා වෙමින් වන්දනා කළත්, කිසිවෙක් ඔහු ගැන නොදනී. ඔවුන් ප්‍රජාපිතා බ්‍රහ්මා නියතයෙන්ම ශාරීරික ලෝකයේ සිටින බව පවා තේරුම් ගෙන නැත. ඔවුන් පටලවා ගෙන ඇත. ඔවුන් සිතන්නේ පළමුවෙන්ම ප්‍රජාපිතා බ්‍රහ්මා ස්වර්ණමය යුගයේ සිටිය යුතු ලෙසය. ප්‍රජාපිතා බ්‍රහ්මා ස්වර්ණමය යුගයේ සිටියා නම්, ඇයි ඔවුන් ඔහු සූක්ෂම කලාපයේ පෙන්වන්නේ. ඔවුන් එහි තේරුම නොදනී. පියා පමණයි ඔබට ඥානය දෙන්නේ. ඔහු පැමිණ ඔබට ඥානය දුන් කල පමණයි, ඔබට එය අන් අයට දිය හැක්කේ. අන් අයට පියාගේ හැඳින්වීම ලබා දීම ඉතා පහසුය. ඔබ ඇල්ෆා මූලකුර පමණක් තේරුම් කළ යුතුය. ඒ සියලු ජීවාත්ම සත්තාවන්ගේ අසීමිත පියාය. කාට හෝ ඔහුගේ හැඳින්වීම ලබා දීම අපහසු නැත, එය ඉතා පහසුය. කොහොමනමුත්, ඔබට එම ශ්‍රද්ධාව සහ පුහුණුව නැත්නම්, අන් අයට තේරුම් කළ නොහැකිය. ඔබ කාට හෝ මේ ඥානය නොදෙන්නේ නම්, එහි තේරුම ඔබට ද ඥානය නැති බවයි. ඥානය නැති වූ කල, එවිට එය භක්තියයි. එහි ඇත්තේ ශරීර අවධානයයි. ජීවාත්මසත්තා විඥානය තිබෙන අයට පමණයි ඥානය ඇත්තේ. මම ජීවාත්මයක් වන අතර, මගේ පියා, උත්තරීතර පියා, උත්තරීතර ජීවාත්මය වූ කලී පියා, ගුරුවරයා සහ සත්ගුරු ද වේ. ප්‍රජාපිතා බ්‍රහ්මා ද ඇත. පියා, ප්‍රජාපිතා බ්‍රහ්මාගේ රැකියාවත්, ඔහුගේ ක්‍රියාත් ඔහුට කියා ඇත. මිනිසුන් ශිවා හා ශංකර් පටලවා ගෙන දෙදෙනාම එක්කෙනෙක් බව කියයි. ඔවුන් කියන්නේ

ශංකර්ගේ ඇස විවෘත කළ විට, විනාශය සිදු වූ බවයි. විනාශය සිදුවන්නේ බෝම්බ සහ ස්වභාවික ව්‍යසන මගිනි. ඔවුන් මෙසේ කියයි ශිවා, ශංකර්, මහාදේව්! එම පිංතූර නිරවද්‍ය නොවේ. ඒ සියලු පිංතූර අයත් වන්නේ භක්ති මාර්ගයටයි. එවැනි කිසිවක් නැත. ප්‍රජාපිතා බ්‍රහ්මා ශාරීරික කෙනෙකි. ඔහුට බොහෝ දරුවන් සිටී. එහි එවැනි කිසිවක් නොමැත. ඒ සියලු පිංතූර වන්දනා සඳහාය. පියා ඔබට මෙසේ විස්තර කරයි මේ බ්‍රහ්මා ශාරීරික (ව්‍යක්ත්) වන අතර අනෙක් කෙනා සූක්ෂමය (අව්‍යක්ත්). ඔහු අව්‍යක්ත් බවට පත් වූ විට ඒන්ජල් වේ. නියතයෙන්ම ස්ථාන දෙකම ඇත අශරීරික ලෝකය සහ සූක්ෂම කලාපය. ඔබ සූක්ෂම කලාපයට ද යනවා. මනුෂ්‍යයෙක් වන ප්‍රජාපිතා බ්‍රහ්මා ඒන්ජල් බවට පත් වන ආකාරය පියා විස්තර කර දී ඇත. එවිට, ඔහුට රාජධානිය ද පෙන්වීය. ඔහු එහි පාලකයා වේ. සූක්ෂම කලාපයේ පිංතූර නොමැතිව මේවා විස්තර කර දීම අපහසුය. ඇත්තෙන්ම අත් හතරේ විෂ්ණු ප්‍රතිමාවක් නොතිබේ. එය භක්ති මාර්ගයේ පිංතූරයකි. අපිරිසිදු බවින් පිරිසිදු බවට පත් විය යුත්තේ, ජීවාත්ම සත්තාව බව පියා විස්තර කරයි. ජීවාත්ම සත්තාවන් පිරිසිදු වී ආපසු ඔවුනගේ දේශයට යයි. ජීවාත්ම සත්තාවන් අශරීරික ලෝකයේ පදිංචිව සිටි අතර මෙහි පැමිණ ශාරීරික බවට පත් වෙයි. කොහොමනමුත් සූක්ෂම කලාපයේ සිට වැදගත් කතාන්දරයක් කියා නැත. මෙකල පමණයි, සූක්ෂම කලාපය පිළිබඳ රහස්, පියා ඔබට තේරුම් කර දෙන්නේ. ඉතින් අශරීරික ලෝකය, සූක්ෂම කලාපය, ශාරීරික ලෝකය ද ඇත. ඒ නිසා, සියල්ලට පළමු සැම කෙනෙකුට ම පියාගේ හැඳින්වීම ලබා දෙන්න. භක්ති මාර්ගයේ දී මිනිසුන් බාබාට 'ඕ දෙවියනි! ඕ ප්‍රභූනි!' කියා කෑ ගැසුවත් ඔවුන් ඔහුව දන්නේ නැත. සැම විට කියන්නේ 'උත්තරීතර ජීවාත්මය වන ශිවාට නමස්කාර වේවා' කියා මිස 'සුර දේවතාවාට' කියා නොවේ. 'බ්‍රහ්ම දේවතාවා' යැයි කියයි. ශිවා යනු උත්තරීතර පියා, උත්තරීතර ජීවාත්මය වෙයි. ශිව දේවතාවා යැයි කිසිවෙක් කිසි විටෙක නොකියයි. කියැවෙන්නේ 'උත්තරීතර ජීවාත්මය ශිවා' කියාය. ඔහු සර්ව ව්‍යාපී නොවේ. ඔහු අපිරිසිදු අය පිරිසිදු කිරීමේ ක්‍රියාව සිදු කළ යුතුයි. ඒ නිසා ඔහු ගස් ගල් කැට කැබැලිති වලට ඇතුළු වී එය කළ හැකිද? ඒ ඝණ අන්ධකාරයයි. මෙයද නාටකයේ නියමිත වූවකි. පියා පැමිණ විස්තර කරන්නේ අන්ත අනාගමික බව ඇති විටයි. කාට අපහාස කිරීමක්ද? ඒ මිනිසුන් ගාථා කියමින් ඒවායේ තේරුම් කියයි. ඔබ දරුවන් ගොස් බැලිය යුතුයි එය කරන හැටි. ඔබ ඔවුන්ට මෙසේ කිව යුතුයි මෙහි තේරුම අපි ඔබට කියා දෙන්නම්. එවිට, සෘජුවම මේ ඥානය දෙන්න. ඔවුන් ඔබ බීකේ බව නොදනී. ඔබ සුදු ඇන්දත් ඔබට මුද්‍රාවක් නැත. ඔවුන්ට කන් දී ඒ තැන් වලදී ඔබට ගොස් ඔවුන් කියන දේ තේරුම ඇසිය හැකියි. බලන්න මොනව කියයිද කියා. මේ සියලු පිංතූර වැඩි විස්තර සඳහාය. ඥානය බොහෝ ඇත. මුළු සාගරය තීන්ත බවට පත් කළත් ඥානය ලියා අවසන් කළ නොහැකියි. ඊට තත්පරයක් ගත වන බවද ඔබට කියා දී ඇත. ඔබ කළ යුත්තේ පියාව හඳුන්වා දීමයි. එම අසීමිත පියාමයි දෙව් ලොව නිර්මාණකයා. ඔහුගේ දරුවන් වන අප සැම සහෝදරයින්ය. ඉතින් අපිට නියතයෙන්ම දෙව්ලොව රජ දහන ලැබේ. කොහොමනමුත්, හැම කෙනාටම එය නොලැබේ. පියා එන්නේ භාරතයට වන අතර භාරත්වාසීන් පමණයි දෙව්ලොව වැසියන් වන්නේ. අන් අය එන්නේ පසුවීය. මෙය ඉතා පහසු වුවත් ඔවුන්ට නොතේරේ. බාබාට ද පුදුමයි. දවසක නැටුම්කරුවෝ පවා ඇහුම්කන් දේවි. අවසානයේ දී එන අය වඩාත් දක්ෂ වේ. කාට හෝ ගොස් ඔවුන්ට සේවය කළ හැකිය. ඔබ බොහෝ දෙනා කලබල වෙයි. ශරීර අවධානය බොහෝ වෙයි. බාබා මෙසේ කියයි ඔබ වෙශ්‍යාවන්ට ද විස්තර කර දිය යුතුයි. භාරතයේ නම කෙලෙසුවේ ඔවුන් ය. මෙහිදී අවශ්‍ය ප්‍රධාන දේ නම් යෝගා බලයයි. සැම කෙනෙක්ම සම්පූර්ණයෙන්ම අපිරිසිදු වී ඇති නිසා, පාරිශුද්ධිය සඳහා මෙම ස්මෘති වන්දනාව අවශ්‍යම වේ. වර්තමානයේ එම ස්මෘති බලය ටිකක් අඩු වී ඇත. ඇතැම් අයට ඥානය තිබුණත් ස්මෘතිය අඩුය. මෙය අමාරු විෂයකි. ඔබ මෙය සමත් වූ විට පමණයි, ගුණාංග වලින් තොර අය නංවාලිය හැක්කේ. හොඳ අත්දැකීම් ඇති මව්වරුන්ට ගොස් ඔවුන්ට විස්තර කළ හැකියි. කුමාරීන්ට එම අත්දැකීම් නැත. පියා මෙසේ කියයි පාරිශුද්ධ වූ විට ඔබ ලෝකයේ හිමිකරුවන් බවට පත් වේ. ලෝකය මුළුමනින්ම ශිවාලය බවට පත් වෙයි. ශිවාලය යනු ස්වර්ණමය යුගයයි. එහි බොහෝ සතුට ඇත. ඔබට ඔවුන්ට මෙසේද කිව හැකියි පියා මෙසේ කියයි දැන් පාරිශුද්ධව සිටීමට පොරොන්දු වන්න. එවැනි අපිරිසිදු අය පිරිසිදු කිරීමේ කඩුව ඉතා තියුණු විය යුතුය. ඇතැම් විට එයට තව කල් ඇත. ඔබේ විස්තර කිරීමද අනුපිළිවෙලිනි. මධ්‍යස්ථාන වල ජීවත්වන අයද සැම එක ලෙස නොවන බව බාබා දනී. පිටට ගොස් සේවය කරන අයගේ වෙනස දවල් රෑ මෙනි. ඉතින් සියල්ලටම පළමු, කාට හෝ තේරුම් කරන විට පළමුවෙන්ම පියාව හඳුන්වා දෙන්න. පියාව පසසන්න. මේ සියලු ගුණාංග ඇත්තේ පියාටම මිස වෙන කෙනෙකුට නොවේ. ඔහු පමණයි ඔබව ගුණවන්ත කරවන්නේ. පියාම ස්වර්ණමය යුගය ස්ථාපනය කරයි. ඔබ ඉතා උසස් තත්ත්වයට පත් වන සංගම් යුගයයි දැන් මේ ඇත්තේ. ඔහු මෙහි හිඳගෙන, ඔබ ජීවාත්මයන්ට මෙසේ කියයි ශරීරය ජීවාත්මයට අයත් එකක් ලෙස විස්තර කරන්න. කෙනෙක් කොපමණ දුරට තේරුම් ගන්නවාදැයි

ඔවුන්ගේ මුහුණින් පෙනේ. හැඟීම් බර අයගේ මුහුණු සම්පූර්ණයෙන් වෙනස් වේ. ඔබ මෙහි සිට ඔබ ජීවාත්මයක් යැයි සලකයි නම්, ඔබේ මුහුණ ලස්සනට තිබේවි. මෙයද පුහුණු කළ යුතුය. ගෙවල් වල පවුල් සමඟ ජීවත් වන අයට ඔවුන්ගේ ලෞකික වැඩ ඇති නිසා මෙම පිම්ම ගත නොහැකිය. ඔවුන් යන එන අතර තුර දීත් මෙය පුරුදු පුහුණු කළ විට පමණක් එය දැඩි සේ ස්ථාවර වේ. ස්මෘතිය තබා ගැනීමෙන් පමණකි, ඔබ පාරිශුද්ධියට පත් වන්නේ. ඔබ යෝගාවෙහි රැඳී සිටින තරමට, ඊට අනුකූලව ඔබ පාරිශුද්ධියට පත් වේ. ස්වර්ණමය යුගයේ දී, ඔබ සතෝප්‍රධාන් වූ අතර ඉතා සතුටින් යුතු විය. ඔබ දැන් මෙම සංගම් යුගයේ දී ද, සිනහවෙමින් ප්‍රීති වේ. ඒ නිසා දැන් ඔබට අසීමිත පියා හමු වී ඇති බැවින් තවත් ඕනෑ මොනවාද? ඔබ පියාට කැප විය යුතුමයි. ධනවත් අය මතුවන්නේ ඉතා කලාතුරකිනි. දුකට පත් අය මෙය ලබා ගනී. නාටකය සැදී ඇත්තේ එලෙසය. ක්‍රම ක්‍රමයෙන්, ටිකෙන් ටික ප්‍රසාරණය දිගටම සිදුවේ. මිලියන ගණනකින් අතලොස්සක් ජයග්‍රහණයේ මාලයට අයත් වේ. කොහොමනමුත්, යටත් වැසියන් ද අනුපිළිවලින් බිහිවිය යුතුය. එවැනි බොහෝ අය නිර්මාණය වේ. ධනවත්, දුප්පත් හැම අයම සිටී. සම්පූර්ණ රජ දහනක් බිහිවේ. අන් සියලු දෙනා ආපසු ඔවුන්ගේ අංශ වලට යනු ඇත. බාබා මෙසේ විස්තර කරයි දරුවනි, ඔබ දිව්‍යමය ගුණාංග ද උකහා ගත යුතුව ඇත. ඔබේ කෑම සහ බීම ඉතා හොඳ විය යුතුය. ඔබට විශේෂ යමක් කෑමට අවශ්‍ය නොවිය යුතුය. එවැනි අභිලාශයන් මෙහිදී මතු වේ. බාබා විශ්‍රාමික තත්ත්වයේ සිටින අයගේ ආශ්‍රම දැක ඇත. ඔවුන් එහි සාමයෙන් සිටී. මෙහිදී, පියා මෙම අසීමිත සියලු දේහි තේරුම් විස්තර කරයි. වෛශ්‍යාවන් සහ ගුණාංග නොමැති අය පැමිණ ඔබට ද වඩා දක්ෂ අය බවට පත් වනු ඇත. ඔවුන් ඒ පිළිබඳ එවැනි පළමු පංතියේ ගී ගයන විට ඔබේ සතුටේ රසදිය කඳ ද ඉහළ නඟිනු ඇත. එසේ බොහෝ පහළට වැටුණු අයට ඔබ තේරුම් කර ඔවුන් උසස් කළ විට ඔබේ නම ද බැබලේ. ඔවුන් මෙසේ කියයි ඔබ වෛශ්‍යාවන් ද උසස් කරයි. ඔවුන් ම මෙසේ කියයි අප ශුද්‍රව සිටියා, දැන් බ්‍රහ්මින් වෙලා සිටිනා අතර ඉන් පසු දේවතා බවටත්, ක්ෂත්‍රියන් බවටත් පත් වේ. ඔවුන්ට දියුණු විය හැකිද නැත්ද යන්න පිළිබඳ ව හැම කෙනෙක් ගැනම බාබාට කිව හැකිය. අවසානයට එන අයට, ඔවුන් ද පසු කර යා හැකිය. ඔබ ඉදිරියට යන විට හැම දෙයක්ම පෙනේවි. දැනුදු ඔබට පෙනේ. අළුත් දරුවන්ට සේවය සඳහා බොහෝ සතුට ඇත. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කාලයක් තිස්සේ නැති වී සිට මේ දැන් හමු වුණු ඔය දරුවන්ව ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. අපිරිසිදු අයව පිරිසිදු කිරීමේ සේවය කරන්න. වෛශ්‍යාවන්ට පවා ඥානය දී ගුණාංග නැති අයද, පහළට ම වැටුණු අයද ඉහළටම නඟාසිටුවන්න. ඔවුන් නංවාලු කල ඔබේ නම ද බැබලේවි.
2. ඔබේ දැක්ම පිරිසිදු බවට පත් කිරීමට නම්, යන එන ගමන් මෙසේ පුහුණු කරන්න 'මා ජීවාත්ම සත්තාවක්මි. තවත් ජීවාත්ම සත්තාවකට මම කතා කරමි.' පියා ගැන ස්මෘතියෙන් සිටින විට ඔබේ පාරිශුද්ධ බව ඇති වනු ඇත.

**වරදානය:** ඔබ හුදකලාව සිටිමින්, විනාඩියක ඒකාග්‍රතාවය තිබීම තුළින්, ශක්තිමත් අත්දැකීමක් ලබා, අන් අයට ද එය ලබා දෙන්න.

හුදකලාව සිටීම යනු, තමන්ව ශක්තිමත් මානසික ස්ථිතියක ස්ථාවර කර ගැනීමයි. ඔබට තමන්ව බීජ අවස්ථාවේ ස්ථාවර කර ගත හැක, ඔබට ප්‍රදීපාගාරයක් සහ බලාගාරයක් වී, ලොවට ආලෝකය සහ බලය ලබා දිය හැක, නැතහොත් ඔබට සුරහන ස්ථිතියේ ස්ථාවර වීමෙන්, අන් අයට අව්‍යක්ත ස්ථිතියේ අත්දැකීම ලබා දිය හැක. ඔබ ඒකාග්‍රතාවයට පත් වී, විනාඩියක් හෝ තත්පරයක් මෙම ස්ථිතියේ ස්ථාවර වන්නේ නම්, තමන්ට සහ අන් අයට බොහෝ යහපතක් සිදු කළ හැක. ඔබ කළ යුත්තේ මෙය පුහුණු කිරීම පමණයි.

**පාඨය:** බ්‍රහ්මචාරිවරයෙක් යනු, තම සෑම සිතිවිල්ලක සහ වචනයකම, පවිත්‍රතාවයේ චිත්ත තරංග මුසු වී ඇති කෙනෙකි.

***** ඕම් ශාන්ති *****

.

**බ්‍රහ්ම පියාට සමාන වීම සඳහා විශේෂ උත්සාහයන්.**

බ්‍රහ්ම පියා හා සමානව සුරඟන ස්ථිතිය අත්විඳීම සඳහා, ක්‍රියා සිදුකරන අතර, විටින් විට, අශාරීරික සහ සුරඟන ස්වරූප ගෙන, තම මනස අභ්‍යාසයේ යොදවන්න. ඔබ බ්‍රහ්ම පියාව ශාරීරික ස්වරූපයේ දුටුවා - ඔහු සෑම විටම සිටියේ ආලෝකමත්ව සහ සැහැල්ලුවෙන්. ඔහුට සේවය ගැන පවා කිසිදු බරක් තිබුණේ නැහැ. ඒ ආකාරයෙන්ම පියා අනුගමනය කරන්න, එවිට ඔබ පහසුවෙන් පියාට සමාන වනු ඇත.